# මෙරීගේ දිනපොත





එවින්දි උමලි අයත්මා මනම්පේරි

# මේරිගේ දිනපොත

එවින්දි උමලි අයත්මා මනම්පේරි

කතෘ

කතෘගේ වෙනත් කෘති

- අපූරු සෙල්ලම
- සුරංගනා ලෝකය
- නත්තල් සීයා
- අභිරිහස් චාරිකාව

| | |
|---|---|
| පාසල | මහ/ මහාමායා බාලිකා විද්‍යාලය |
| පන්තිය | 10 වසර D |
| කෘතිය පළ කරන දිනය | 2026-06-15 |
| ISBN No. | 9786242114064 |

# පිදුම

මගේ ආදරණීය අප්පච්චීටත් අම්මාටත්

මට පුංචි කාලේ ඉදන්ම අකුරු

ඉගැන්වූවාට ස්තූතියි

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළඳා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

# <u>මේරිගේ දිනපොත</u>

ඔන්න යාළුවනේ අද තමයි අපේ ඉස්කෝලේ නත්තලට නිවාඩු දෙන දවස. මේ කාලේ නම් කොහොමත් හිම වැටෙන හින්දා  සීතලයිනේ. මට හරිම ලස්සන දින පොතක් තියෙනවා. ඒක මට අම්මා මගේ උපන්දිනේට මේ අවුරුද්දේ මුල දුන්නේ. ඒක ඇත්තම කිව්වොත් මට ගොඩක් වටිනම සහ රහසිගත දිනපොතක් කිව්වොත් හරි. මම මගේ සැලසුම්, රහසිගත දේවල් හා මගේ පෞද්ගික දේවල් ඔක්කොම ඒකේ ලියලා තියෙනවා. දැන් අපි කතාවට යමු.

**2025-12-07**

අද තමයි ඉස්කෝලේ නත්තලට නිවාඩු දෙන්නේ. ඒ හින්දා මම නම් අද හරිම සතුටින් තමයි ඉස්කෝලේ යන්නේ,

''මේරි නැගිටින්න,ඉස්කෝලේ යන්නැද්ද? දැන් වෙලාව 7.00 යි.  මම කීයක් වැඩ කරන්න ඕනෙද ? කියන්නකෝ. ඔයා දැන් ලොකු ළමයෙක් හින්දා උදෙන්ම නැගිටින්න පුරුදුවෙන්න ඕනේ''.

අපොයි, උදෙන්ම අපේ අම්මාගේ කරච්චලේ. ඒක අහන් ඉන්නවාට වඩා හොඳයි ඩ්‍රම් සෙට් එකක් අරන් මගේ කන ළඟ ගැහුවා නම්. මම 7.15 වෙන කොට ලෑස්තිවෙලා පාරට යනකොට ස්කූල් බස් එක යනවා.

ඊට පස්සේ මම තවත් බස් එකක් එනකල් එතැන ඉඳලා ඉස්කෝලෙට යනකොට 7.30 යි. නූලෙන් තමයි අදත් බේරුණේ. අද අපිට පළවෙනියටම තියෙන්නේ මිස් ලාරා ගේ ප්‍රංශ පාඩම. එයා උගන්නන

වෙලාවට පංතියේ මීක් සද්දයක් නෑ. ඉතින් කොහොමහරි අපේ පංතියේ ජූලියට්ගේ උපන් දිනේ අද අපි ඒක සමරන්න මිස් ලාරාගේ කාලච්ඡේදය ඉල්ලුවා. ඒත් එයා නම් කැමති වුනේ නෑ. එයා කිව්වා මං ඕන්නම් මගේ කාලච්ඡේදයෙන් විනාඩි 5 ක් දෙන්නම් කියලා.

අපි ඉතින් කොහොම හරි ඊට පස්සේ,

''හැපි බර්ත්ඩේ ටූ යූ හැපි බර්ත්ඩේ ටු යූ
හැපි බර්ත්ඩේ ඩියර් ජූලිට් හැපි බර්ත්ඩේ ටු යූ ''
චොරොස්

''මේරි ! පංතියෙන් එළියට''

අයියෝ හරිම වැඩේ තමයි වුණේ

මම තමයි ජූලියට්ගේ මූණට කේක් එක ගහන්න හිටියේ. ඉතින් ජූලියට් ළඟ හිටපු පුංචි ලේන් පැටියා බිමට පැන්නා. එයා ඉතින් ඒ ලේන් පැටියාව ගන්ඩ බිමට නැමෙන කොටම මම කේක් එක ගහන්න ලෑහැස්ති වෙලා හිටියා. හැබැයි ඒක වැදුනේ මිස් ලාරාගේ මූණට.

**2025-12-08**

ටික්. ටික්. ටික්. ටික්

මම ඔර්ලෝසුව ඕෆ් කරලා ආයෙත් නිදාගත්තා. අද සෙනසුරාදා හින්දා මම එදාට තමයි හොදටම නිදාගන්න දවස. කොහොමහරි මම තව පැයක් විතර වැඩිපුර නිදගෙන ඇදෙන් බිමට බැහැලා පළවෙනි අඩිය තියෙන කොටම,

දඩාස්

''අම්මෝ අද දවස නම් හරිම අසුභ දවසක්. කවුද මන්දන්නෑ කෙසෙල් කාලා ලෙලි මගේ කාමරේ දාන්නේ''.

වැටුණ පාරට මොලෙත් හෙල්ලුනාද කොහොදෝ. මම පල්ලෙහාට එනකොට අම්මයි තාත්තායි වැඩට යන්න හදන්නේ. ඒ කියන්නේ අනිවාර්යෙන්ම අද අපේ නංගිව බලාගන්න මිසිස් ගාඩිනියා එනවා. අපෝ මම නම් කැමතිම නෑ එයාට. එයාගේ පෙනුම කිව්වොත් හරිම මහතයි. ඒ වාගේම එයා අඳින්නේ ඇඟට හිර, එක එක විචිවූර්ණ ඇඳුම්. එයා ආවහම අපි එයා කියන විදිහට තමයි ඉන්න ඕනේ. සෙල්ලම්කරන්න බෑ. කෑගහන්න බෑ. එළියට යන්න බෑ. එයා මුකුත්ම කරන්න දෙන්නෑ.

''වින්ඩි, මේරි පරිස්සමෙන් ඉන්න. එහෙනම් අපි යනවා.''

වින්ඩි කියන්නේ මගේ නංගිට. එයා තාම ඉන්නේ 2 වසරේ එයා හොඳමයි කියන්න බෑ. ඒත්  අපි දෙන්නා එකතුවෙලා වැඩ කරන වෙලාවල්

තියෙනවා. හැබැයි වෙලාවකට අපි දෙන්නට අපි දෙන්නව පොඩ්ඩක්වත් පෙන්නන්න බෑ.දැන් ඉතින් අපිට ඉන්න වෙන්නේ මිස් ගාර්ඩිනියා කියන විදිහට තමා මම ඉස්සෙල්ලාම ගිහින් ටිවි එක බලන්න සෝෆා එක උඩ වාඩිවුනා. මගේ පුරුද්දක් විදිහට හැමදාම සෙනසුරාදා උදේම කාටුන් බලනවා. විනාඩි 10 යි ගියේ,

''මේරි ටීවී එක ඕෆ් කරලා, පාඩම්  වැඩ කරගන්න.''

''මම තව ටිකකින් කරන්නම් මිස් ගාර්ඩිනියා.''

''මම ඔතෙන්ට ඇවිත් ටිවී එක ඔෆ් කරන්නද ? නැතිනම් දැන්ම යනවාද?
''

ඇත්තමයි මෙයාගෙන් නම් පුදුම කරදරයක් තියෙන්නේ. අපේ නංගිට අද එයා තමයි කවන්නේ.

''ඉක්මනට කනවා ළමයෝ, මගේ අතත් රිදෙනවා මේ හැන්ද අල්ලන් ඉඳලා''

මට කාමරේට ඇහෙනවා. එයා නංගිට කෑගහනවා.

''මේ ඔක්කොම කන්න ඕනේ, තේරුණාද ?

බෑ කියලා කොහොමද? කනවා ඔක්කොම. නැත්නම් තමුන්ට මම මෙච්චර හොඳින් කියන්නෑ........ මේරි පල්ලෙහාට ඇවිත් ගේ අතුගාන්නකෝ''

''ඒත් ඒවා කරන්න ඕනේ ඔයා, මිස් ගාර්ඩිනියා''

මං මිස් ''ගාර්ඩිනියා'' කියන එක බර කරලා කිව්වේ, ''තමුන්ට ඒකෙන් වැඩක් නෑනේ මං කියන විදිහටයි මේ ගෙදර වැඩ වෙන්නඕනේ''.

වෙලාව සවස 4.00 මම බයිසිකල් පදින්න යන්න දොර ඇරියා විතරයි. අපොයි ඔන්න ආයෙමත් ''මේරි කොහෙද යන්නේ ගෙදර ඉන්න කොහේවත් යන්නද ඔයාගේ අම්මයි තාත්තයි මට ඔය දෙන්න හොඳට බලාගන්න කියලා ගියේ''

''ඒත් මිස් ගාර්ඩිනියා''

''මං දැන් එක පාරක් කිව්වානේ. මං කියනදේ ඇහුවේ නැත්නම් මට ඔයාලාගේ දෙමව්පියන්ට පැමිණිලි කරන්න වෙනවා''.

දැන් අපි රෑ කෑම කන්නයි යන්නේ අම්මලා එන්ට තව පැය 02 ක් වත් යනවා. මොකද එයාලා ඩොක්ටර්ස්ලා නිසා.

මිස් ගාර්ඩිනියා අද නූඩ්ල්ස් හදලා. සුවඳ නම් හොඳයි. හැබැයි පොඩ්ඩක් බෙරි වෙලා වගේ කාලම කලාම තමයි බලන්න වෙන්නේ.

''ඕව්ෑක් අපෝ මේ වල ලුණු මුහුදෙවත් නැතිව ඇති මෙහෙම ලුණු ගොඩක්''.

''කොහොමද ළමයි කෑම ? ''

''අහ් ............. මේ ...  හෝ හොදයි මිස් ගාර්ඩිනියා''

ඔව් ඇත්තටම හොඳයි නේද නංගි ......  අනේ මෙයා කීයට යයිද දන්නේ නෑ.

තවත් නම් මෙයාගේ බොරු බැනුම්යි මෙලෝ රහක් නැති කෑමයි. නීති නම් ඉවසන්න බෑ.
මේකෙට මොකක් හරි කරන්න ඕනේ. මේ වගේ වේලාවට තමයි නංගි මායි එකතුවෙලා වැඩ කරන්නේ.

"This is the Merry's and Windy's time" hahaha

**2025-12-09**

ටික්. ටික්....ටික්.......... වෙලාව උදේ 6.00

දැන් නංගිටයි මටයි කරන්න ලොකු වැඩක් තියෙනවා.අපි දෙන්නා එකතු වෙලා එළකිරි ප්ලෑන් එකක් හැදුවා. ඉස්සෙල්ලම මිස් ගාර්ඩිනියාගේ ඇතුළට එනකොටම බැලූමක් පුපුරනවා. ඊට පස්සේ අපේ ගෙදර හොල්මන් ඉන්නවා වගේ පෙන්නනවා. ආය එයාගේ ඇඳුම් කබඩ් එකට රබර් නයෙක් දානවා. මං නම් හිතන්නෑ අදින් පස්සේ එයා ආය කවදාවත් අපේ ගෙදර නම් එයි. කියලා.

''වින්ඩි මාව ඇහෙනවාද ? මං හිතන්නේ එයා ආවා''

''මම සූදානම්''

''වින්ඩි, මේරි ඔයාලා කොහේද?''

''වින්ඩි දැන් තමයි වෙලාව'' ඩෝං ....

''හරියටම හරි වින්ඩි, මට දැන් පෙනනවා මිස් ගාර්ඩිනියාගේ මූණ වර්ණ විපර්යාසයකට ලක් වී ඇති බව ඒ කියන්නේ මිෂන් Successfully

''ඇයි මේ ගෙදර මෙච්චර කළුවර''.

දැන් මේ යන්නේ ශිත සෘතුව ඉතින් මේ කාලෙට කොහොමත් පරිසරය අඳුරුයි.

දැන් අපි යන්නේ දෙවෙනි මිෂන් එකට.

මිසිස් ගාර්ඩිනියා දැන් කෙලින්ම යන්නේ එයාගේ කාමරේට ඇඳුමක් මාරු කරගන්නට.

තව සුළු වෙලාවකින්  විශාල කෑගැසීමක් ඇසෙනු බව මාගේ බුද්ධිමත් මොළයට වැටහෙනවා.

''කවුද මාත් එක්ක මේ වගේ සෙල්ලම් කරන්නේ !! වින්ඩි, මේරි දැන් මම පල්ලෙහාට එනවා.තමුන්ලද මගේ මේ ඇඳුම් කබඩ් එකට බොරු නයෙක් දැම්මේ?
, මිසිස් ගර්ඩිනියා.

''හොඳයි මං හොයා ගන්නම්කෝ''

''ඩිං ඩොං .... ඩිං ඩොං''

''ඉන්න එනවා. කෝ ? කවුරුත් නෑනේ''

මට දැන් ඇහුණානේ door bell එක ring වෙනවා. මට නිකං ඇහුනා එකක් වෙන්න ඇති  again ඩිං ඩොං ..... ඩිං ඩොං

කවුරුත් නෑනේ. කවුද මාත් එක්ක සෙල්ලම් කරන්නේ මොකක්ද? ඒ සද්දේ ඒක කුස්සිය පැත්තෙන් නේද ඇහුණේ. මං හිතන්නේ පූසෙක් වෙන්න ඇති.

එකපාරටම කරන්ට් එකත් ගියා නේද?

කවුද ඒ මුමුණනවා වගේ ඇහෙන්නේ ?

''කවුද?  ඔතන ඉන්නේ '' මාත් එක්ක සෙල්ලම් කරන්න හදන්න නම් එපා. මේ ගෙදර හොල්මන්වත් ඉන්නවාද ? කවුද බෙල් එක ඔන් කරේ. බයවෙන්න එපා ගාර්ඩිනියා මම මටම කියා ගත්තා. කවුද වොෂ් රූම් එකේ ටැප් එක ඇරියේ. වතුර හෝ ගාලා යනවා. ඒත් එක පාරටම මගේ ඇඟට ලොකු සුදු රෙද්දක් වැටුණා.

''බුදු අම්මෝ මම නම් තවත් මේ ගෙදර ඉන්නෑ.

''අපේ සැලසුම හරියටම වැඩ කරා නේද? වින්ඩි දැන් අපි නිදහස්''

''අපි දෙන්නා වැඩක් කරොත් කොහොමත් එහෙම තමා දාන්න පහක්''

''ළමයි ඔයාලා ඉන්නවාද ?''

''අම්මයි තාත්තයි අද කලින්ම ගෙදර ඇවිත්''

ආ ඔව්, මිසිස් ගාර්ඩිනියා කිව්වා. එයාට ටිකක් සනීප නැතිව ගෙදර ගියා කියලා.

එයට කමක් නෑ මං හිතන්නේ මේරිට පුළුවන් වෙයි නංගීව බලා ගන්න නේද ?

**2025-12-10**

අද ඉතින් මට තමයි නංගිව බලාගන්න වෙන්නේ.

දැන් මම යන්නේ උදේට කන්න අපිට පීසා හදන්න. ඉස්සෙල්ලාම අපි පිටි ටික හොඳට අනා ගන්න ඕනෙ.ඊළඟට අපි කැමති පේස්ට් එකක් හදලා තමන්ම කන්න කැමති දේවල් දාන්න ඕනේ. මම ඉතින් අද හදන්නේ Mushroom Pizza එකක්. ඒත් ගෙදර Mushroom නෑ. අපි බලමු Garden එකේ තියෙයිද කියලා. ම්... මං හිතුවා හරි අර තියෙන්නේ දැන් මේ ටික කපලා පිටි එකට දාන්න ඕනේ. දැන් අපිට තියෙන්නේ මේක බේක් කරන්න.

අසමසම රසම රස මේරි විසින්ම සෑදු පීසා එකේ රස බලන්න හමුවන වාසනාවන්තයා කවුරුන් විය හැකිද ? මම ඒ වටිනා අවස්ථාව ඔබට ලබාදීමට කැමතියි වින්ඩි''.

''ම්... හොඳයි.ඇත්තටම රසයි.

මේ ඔක්කොම මං කනවා හරිද?

*A few minites later,*

''අක්කේ, මගේ බඩ රිදෙනවානේ. මට නිකන් කලන්තේ වගේ.''

''ඉන්න මම ඩොක්ටර්ට කතා කරන්නම්''

''වින්ඩි, ඩොක්ටර් එන්නම් කිව්වා''. වින්ඩි මොකද වුණේ කතා කරන්නකෝ.

''මේ මිස් මේරිගේ ගෙදර ද ?''

''අනේ ඔව් ඩොක්ටර් බලන්නකෝ අපේ නංගීට සිහිය නෑනේ''

''මං හිතන්නේ වින්ඩිට මෙනවාහරි ඇලජික් වෙලා'' ඔයාලා මොනවාද කෑවේ? ඒ කියන්නේ ඒ Mushroom තමයි ඇලජික් වෙලා තියෙන්නේ බයවෙන්න එපා. වින්ඩිට තව පැය 2 කින් වගේ හොඳ වෙයි. එහෙනම් මම ගිහින් එන්නම්''

''අනේ Thank you Doctor''

මං නම් හිතාගත්තා ආය නම් කිසිම කෑමක් හදන්න හොඳ නෑ කියලා ඔයින් ගියා මදෑ මං මේකෙන් තේරුම් ගත්තා මට තනියෙන් නංගීව භාරගන්න බෑ කියලා.

**2025-12-11**

''ළමයි ඔයාලට අලුත් අමුත්තෙක් ඉන්නවා''. මිස් ස්කේට් අද පොඩි ගමනක් යනවා කිව්වා. ඉතින් එයා එනකල් අපිට මේපල් බලාගන්න වෙනවා. බලන්නකෝ එයා හරිම හුරතල් නේ. හරි ළමයි මම දැන් ඔෆිස් යන්න ඕනේ. මං හිතනවා ඔයාලා මෙයාව හොඳට බලාගනියි කියලා. බායි පරිස්සමෙන් ඉන්න''

ඉතින් කොහොමද මේපල් මගේ නම තමයි මේරි. එතකොට මේ ඉන්නේ මගේ නංගි වින්ඩි. දැන් ඉතින් ඔයා දඟ කරන් නැතුව ඉන්න ඕනේ තේරුණාද ? මං ලස්සන පේන්ටින් එකක් කරා ඔයාටත් බලන්න ඕනේද ? දැන් අපි මේක වේලෙන්න අව්වෙන් තියමු.

මට ඉස්කෝලේ වැඩ ටිකක් තියෙනවා. මං ඒක ඉවර කරලා එනකන් ඔයා මෙතැනම ඉන්න. ඕනේ තේරුණාද ?

අයියෝ මේපල් ඔයාද මේ වැඩේ කරේ. ඔයාට ජරා කරන්න වෙන තැනක් තිබුනේම නැද්ද?. දැන් මං මේ ටික අස් කරනකන් ඔයා එළියෙන් ඉන්න ඕනේ හරිද ?

දැන් ඔක්කෝම හරි. මේපල් එන්න ඇතුළට.

කෝ එන්න ඉතින්. පොඩ්ඩක් ඉන්න. මේපල් මොකද ඔයා කරන්නේ කෝ මෙහෙට එන්න. ඔයා සපත්තුව තියලා එන්න. අයියෝ ! එයා මිස්ටර් ජෝර්ජ් ගේ වත්තට ගිහිල්ලා.ඒ මදිවට මිස්ටර් ජෝර්ජ්ගේ සපත්තුවක් හපනවා. එයා දැක්කොත් නම් ඉවරයි. දැන් මං මොකද කරන්නේ. එයාට

කන්න කතා කළොත් නම් අනිවාර්යයෙන්  එයි. ''මේපල් එන්න කන්න. මේ බලන්න ඔයාට ලොකු  මස් කට්ටකුත් තියෙනවා''. හොඳ ළමයා ඇති යාන්තං.

අපි දැන් මොකද කරන්නේ. සෙල්ලමක් කරමුද ? ඔයා අල්ලන්න. මං දුවන්නම් හරිද. කෝ මාව අල්ලන්න ඉතින් මං නම් හිතන්නෑ ඔයාට මාව අල්ලන්න පුළුවන්  වෙයි කියලා. මාව ඇල්ලුවානේ කොහොම හරි. මේපල් වැඩ්ඩා. හරි මං තේ හදන් එනකං ඔතැනම ඉන්න.

මේපල් ආ ඔයාට කුකීස්.

ඒ මොනවාද ඔය කරන්නේ. අම්මා දැනගත්තොත් නම් මේ අපි දෙන්නටම බැනුම් තමා. හැබැයි ඉතින් ඒකත් නරක නෑ. මේ පුළුන් නම් මාර ෂෝක් කෝ එන්න දැන් මං ඔයාගේ ඇඟට මේ පුළුන් කොට්ටේම හලන්න යන්නේ.

අම්මෝ දැන් නම් හරිම මහන්සියි.

ඩිං ඩොං .....ඩිං ඩොං ....

කවුද මේ වෙලාවේ,

''අනේ මේ මිස ස්කේට්නේ''

''කෝ මේපල් ඉන්නවාද? මං මේ එයාව අරන් යන්ට ආවේ! අනේ ඔව් ඉන්නවා. මේපල් මෙන්න ඔයාගේ අයිතිකාරයා ඇවිල්ලා''. මේ ඉන්නේ, එහෙනම් මම ගිහින් එන්නද ?

‘‘ආ හරි. පරිස්සමෙන් යන්න Bye Mapel’’

‘‘බ්‍රහ්... බ්‍රහ්..’’

**2025-12-12**

මේ අවුරුද්දත් දැන් ඉවර වෙන්නයි යන්නේ. මට කාමරේ අස් කරගන්නත් තියෙනවා. මාගේ පරණ දිනපොත් හුඟාක් තියෙනවා එක පෙට්ටියක. ඒත් ප්‍රශ්නේ ඒවා ඔක්කොම පුරවාගෙන ඉන්න බෑනේ. මං එතකොට මොකද දැන් කරන්නේ. කොහොමත් මං ඊළඟ අවුරුද්දට අලුත් දිනපොතක් ගන්නවා.

මට ආවා අදහසක්. මං මගේ මේ අවුරුද්දේ Diary එක අපේ වත්තේ හංගනවා.

බැරිවෙලාවත් කොහොමද අනාගතේ මගේ Diary එක පුරාවිද්‍යා කැණීම් කටයුතුවලින් හොයාගෙන මගේ නම ඉතිහාස පොතට එකතුවුනොත් එහෙම. ඒ හින්දා මේ පොත වළදාන එක තමා හොඳම දේ. අපේ අම්මට කියන්න ඕනේ ඔයාට ඉන්නේ ජාතික වීරවරියක් කියලා.

අනාගතේ දවසක මගේ නම ඉතිහාස පොත් වලට එකතු වුණොත් එහෙම කාටද ඉතින් ආඩම්බර

මගේ දිනපොත හම්බවෙන වාසනාවන්තයා ඔයා වෙන්නත් බැරි නෑ.

එහෙනම් ඊළඟ අවුරුද්දේ තවත් මේ වගේම කතාවකින් හම්බවෙනකම් ගිහින් එන්නම්

**නිමි.**

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දෑයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්නමගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ගා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස්ථ වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළඳා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN No. 9786242114064**